රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:19/97(1)

මගේඅංකය: 1x /543/ඊ1272/30
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුත ු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොලඹ 07.
1997.12.31 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

## ජංගම දුරකථන සැපයීම

යථෝක්ත කාරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද රා.පරි.චක්‍රලේඛ 19/97 සහ 1997.08.25 දිනැති චක්‍රලේඛයේ 1 (11) ජේදයට ඔබගේඅවධානය යොමු කරවමි. යථෝක්ත ජේදය පහත දැක්වෙන අයුරින් සංශෝධනය කරනු ලැබේ.

" බාහිර ඇමතුම් සඳහා මාසික දුරකථන ගාස්තුව උපරිමය
රු.2000/- කට යටත් වියයුතු අතර, දුරකථන බිලපත්වලින් 10%
ක් මෙම නිලධාරියාගෙන් අයකර ගැනීමට හා ඊට අතිරේකව
මාසික දුරකථන බිල් රු.2000/- ට වැඩි අවස්ථාවේදී එම වැඩි වූ
මුදල අදාල නිලධාරියාගෙන් අයකර ගැනීම"

02. මෙම ලිපිය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය. මෙම තීරණය 1997.08.25 වන දින සිට ක්‍රියාත්මක වේ.

**අ.කලේ/(ඩික්සන් නිලවීර)**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි
කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්.

**ඇමුණුම් (3)**

**ප්‍රතිලාභ:-**

**ණය සුරැකුම් රක්ෂණය:-**

මෙම රක්ෂණ ක්‍රමය මඟින් ආයතන සංග්‍රහයේ xxx1v පරිච්ඡේදය යටතේ රජයේ ලබාගන්නා වූ නිවාස ණය, දේපළ ණය, වාහන ණය වැනි ඇපකරුවකු හෝ ඇපකරුවන් අවශ්‍ය වර්ග ආවරණය වේ. යම් හෙයකින් රජයට අය විය යුතු ණය මුදලක් ණය කරුට ගෙවිය නො ණය මුදල රක්ෂණ සංස්ථාව විසින් රජයට ගෙවනු ලැබේ.

**ප්‍රතිලාභ:-**

(1) ණයගැතියා රෝගාතුර වීමෙන් හෝ අනතුරකින් අර්ධ හෝ පූර්ණ අකර්මන්‍යතාවය ජීවනෝපාය අහිමි වුවහොත්, හෝ ජීවිත හානියකට පත්වූ විට ණය මුදලේ ඉතිරි ගෙවීමට රක්ෂණ සංස්ථාව බැඳී සිටී.

(11) ණය මුදල - ණය ගන්නා අවස්ථාවේ අවුරුදු **05** ක මාසික වැටුප්වල උපරිම මුදලේ වටිනාකම

(111) රක්ෂිත මුදල - ණය මුදලේ ඉතිරි ශේෂය

(1v ) ණය මුදල ආපසු ගෙවීම - ආපසු ගෙවන කාලය වයස අවුරුදු **55** හෝ සේවා කාලය අවුරුදු **60** නොඉක්මවිය යුතුය.